# අඩු කිරීමේ ගැටලු විසඳීම



## සපයාගත යුතු දේ -

ගැටලු සහිත අවස්ථාවල දී භාවිතය සඳහා පහත සඳහන් දෑ අතුරින් ඔබට පහසුවෙන් සපයාගත හැකි දේවල් තෝරාගන්න.

- ඇට වගර්යකින් 30 ක් පමණ (කඩල ඇට, රබර් අට, මදටිය ඇට ආදී)
- අඟල් 3ක් පමණ දිග ඉරටු කැබලි 30 ක් පමණ
- ටොනික් මූඩි 30 ක් පමණ
- පෙට්ටියක්
- අඩු කිරීමේ ප්‍රකාශන සඳහන් පත්‍රිකා කඩදාසි කොළවල ලියා කාඩ්බෝඩ් කැබලිවල අලවාගන්න.

| | | | |
|---|---|---|---|
| 6 3 | 5 9 | 8 7 | 7 4 |
| - 3 0 | - 4 2 | - 2 5 | - 3 4 |
| ______ | ______ | ______ | ______ |
| ______ | ______ | ______ | ______ |

## ක්‍රියාකාරකම - 01

- මනෝමයෙන් පිළිතුරු ලබාගැනීම සඳහා අඩු කිරීමේ ගැටලු කිහිපයක් දරුවාගෙන් විමසන්න.
- මා ළඟ රඹුටන් ගෙඩි 16 ක් තිබුණා. මා ඉන් 3ක් නංගීට දුන්නා. මා ළඟ ඉතුරු රඹුටන් ගණන කීයද?
- කමලා ළඟ වළලු 8 ක් තිබේ. මාලා ළඟ තිබෙන්නේ වළලු 5 කි. කමලාගේ වළලු ගණනට සමාන වීමට මාලාට තව වළලු කීයක් ඕනෑද?

- තරගයක් දිනීමට අවශ්‍ය ලකුණු ගණන25 කි. දැනට අප කණ්ඩායම රැස්කර ඇති ලකුණු ගණන14 කි. තරගය දිනීමට තව ලකුණු කීයක් අවශ්‍යද?
- මා ළඟ පැන්සල් 16 ක් තිබුණා. මා එයින් 3ක් නංගීට දුන්නා. මා ළඟ ඉතුරු පැන්සල් ගණන කීයද?
- ඉහත ගැටලුව කිහිපවරක් දරුවාට කියවීමට දෙන්න.
- ගැටලුව වගන්ති ලියා විසඳන ආකාරය පියවරෙන් පියවර දරුවාට පැහැදිලි කරන්න.

ඉතුරු පැන්සල් ගණන සොයන්නේ කෙසේද?

මා ළඟ ඇති පැන්සල් ගණන = 16

නංගිට දුන් පැන්සල් ගණන = -3

මා ළඟ ඉතුරු පැන්සල් ගණන =

- මනෝමයෙන් පිළිතුරු දීම සඳහා ලබාදුන් ගැටලුවලට ද වගන්ති ලියා පිළිතුරු ලබාගැනීමට දරුවාට කියන්න (පිළිතුරු ලබාගැනීමට ඇට වගර් භාවිත කරන්න)
- පාඩම අවසානයේ ඇති ඇමුණුම1 හි සඳහන් ගැටලු ලියූ පත්‍රිකා පෙට්ටියකට දමන්න.
- දරුවාට එයින් කැමති පත්‍රිකාවක් ලබාගැනීමට අවස්ථාව ලබාදෙන්න.
- එහි සඳහන් ගැටලුව කිහිපවරක් හොඳින් කියවා වගන්ති ලියා විසඳීමට දරුවාට කියන්න.
- පෙට්ටියෙන් වරකට එක බැගින් ගැටලු පත්‍රිකා 5ක් ගෙන වගන්ති ලියා පිළිතුරු ලබාගැනීමට දරුවාට අවස්ථාව ලබාදෙන්න.

## ක්‍රියාකරකම 02

- දරුවාගෙන් පහත ආකාරයේ ප්‍රශ්න කිහිපයක් අසන්න.
    - 8 න් 3 ක් අඩු කළ විට ඉතුරු කීයද?
    - 16 න් 4 ක් අඩු කළ විට ඉතුරු කීයද?
    - 26 න් 5 ක් අඩු කළ විට ඉතුරු කීයද?
- එකම අඩු කිරීමේ ප්‍රකාශනයක් විවිධ ආකාරයට විසඳිය හැකි බව දරුවාට පවසන්න.
- විසඳිය හැකි ක්‍රම දරුවාට හඳුන්වා දෙන්න.

**I ක්‍රමය**

$$\begin{array}{r} 85 \\ -\ 32 \\ \hline 53 \\ \hline\hline \end{array}$$

- අඩු කිරීම සාමාන්‍යයෙන් සිදුකරන ආකාරය මෙය බව දරුවාට පවසන්න.
- තව ක්‍රමයක් ලෙස මෙලෙස අඩුකර පිළිතුරු ලබාගත හැකි බවද පවසමින් දරුවාට පහදා දෙන්න

**11 ක්‍රමය**

$$\begin{array}{r} 85 \\ -\ 32 \\ \hline 3 \\ +\ 50 \\ \hline 53 \\ \hline\hline \end{array}$$

- මුලින් එකස්ථානයේ 5 න්2 ක් අඩුකර පිළිතුර 3 ලබාගන්න.
- දෙවනුව දහයස්ථානයේ 80 න් 30 ක් අඩුකර පිළිතුර 50 ලබාගන්න.
- දැන් 50 +3 = 53

- පහත අඩු කිරීමේ ප්‍රකාශන ඉහත සඳහන් කළ ආකාරයට ක්‍රම දෙකෙන්ම සාදා පිළිතුරු ලබාගැනීමට දරුවාට අවස්ථාව ලබාදෙන්න.

```
  3 5        6 5        9 7
- 1 2      - 2 4      - 3 3
------     ------     ------

======     ======     ======
```

- සකසා ගත් අඩු කිරීමේ ප්‍රකාශන සඳහන් පත්‍රිකා දරුවාට ලබාදෙන්න.
- දරුවාට වඩාත් පහසු අඩු කිරීමේ ක්‍රමය යොදා ගනිමින් පිළිතුරු සැපයීමට අවස්ථාව ලබාදෙන්න.

## ක්‍රියාකරකම - 03

- පාඩම අවසානයේ ඇති ඇමුණුම හි 2 සඳහන් ගැටලු ලියූ පත්‍රිකා පෙට්ටියකට දමන්න.
- පෙට්ටියෙන් දරුවාට කැමති පත්‍රිකාවක් ලබාගැනීමට අවස්ථාව ලබාදෙන්න.
- ගැටලුව හොඳින් අවබෝධ කරගෙන පිළිතුරු සැපයීමට අවස්ථාව ලබාදෙන්න. ( අවශ්‍ය නම් ඇට වගර් යොදාගන්න)
- පෙට්ටියෙන් වරකට අඩුකිරීමේ පත්‍රිකා එක බැගින් ගෙන පිළිතුරු සැපයීමට දරුවාට කියන්න.

ගණිතය පෙළපොතෙහි පිටු අංක 54, 55,56 අභ්‍යාස සඳහා මඟ පෙන්වන්න

ඇමුණුම 1

පහත පත්‍රිකා වෙන්කර කාඩ්බෝඩ් කැබලිවල අලවන්න.

| |
|---|
| පෙට්ටියක ඇති සුදු සහ රතු බිත්තර ගණන 64 කි. ඒවායින් 23 ක් සුදු බිත්තර වේ. පෙට්ටියේ ඇති රතු බිත්තර ගණන කීයද ? |
| පුවත්පත් වෙළඳසලක විකිණීමට තිබුණු පුවත්පත් ගණන 96 කි.එයින් පුවත්පත් 50 අලෙවි විය. වෙළඳසලේ ඉතිරි පුවත්පත් ගණන කීයද? |
| වෙළෙන්දෙක් ළඟ විකිණීමට තිබුණු දොඩම්ගෙඩි ගණන 89 කි. වෙළෙන්දා එයින් දොඩම් ගෙඩි 56ක් විකිණුවේය. විකිණීමට ඇති ඉතිරි දොඩම් ගෙඩි ගණන කීයද? |
| පුස්තකාලයක තිබුණු සිංහල හා ඉංග්‍රීසි පොත් ගණන 77 කි. පුස්තකාලයේ සිංහල පොත් 54 තිබුණි. එහි ඇති ඉංග්‍රීසි පොත් ගණන කීයද? |
| පාසලක සිටින පිරිමි ළමයින් සහ ගැහැනු ළමයින් ගණන 86 කි. පාසලේ සිටින ගැහැනු ළමයින් ගණන 41 කි. පාසලේ සිටින පිරිමි ළමයින් ගණන කීයද? |
| වට්ටියක ඇති කහ සහ නිල් මල්වල එකතුව 85 කි. එහි ඇති නිල් මල් ගණන 43 කි. වට්ටියේ ඇති කහ මල් ගණන කීයද? |
| කූඩයක ඇති අඹගෙඩි ගණන 59 කි. එයින් ගෙඩි 10 නරක් වී තිබුණි. කූඩයේ ඇති නරක් නොවූ අඹගෙඩි ගණන කීයද? |

## ඇමුණුම 2

පහත පත්‍රිකා වෙන්කර කාඩ්බෝඩ් කැබලිවල අලවන්න.

<table>
<tr><td colspan="4">25 න් 14 ක් ඉවත් කළවිට කීයද?</td></tr>
<tr><td colspan="4">12 – ..... = 10</td></tr>
<tr><td colspan="4">15 – 4 =</td></tr>
<tr><td colspan="4">මා ළඟ වෙරළු ගෙඩි 18 තිබුණා. 7 ක් මා යහළුවෙකුට දුන්නා. මා ළග ඉතුරු වෙරළු ගෙඩි ගණන කීයද?</td></tr>
<tr><td colspan="4">A කණ්ඩායම රැස් කළ ලකුණු සංඛ්‍යාව 25 යි. B කණ්ඩායම රැස් කළ ලකුණු සංඛ්‍යාව 35 යි.කණ්ඩායම් 2 හි ලකුණු සමාන වීමට A කණ්ඩායම රැස් කළ යුතු ලකුණු සංඛ්‍යාව සොයන්න.</td></tr>
<tr><td colspan="4">මගේ පොතේ පින්තූර 16 ක් ඇලවිය හැකිය. මාළඟ ඇති පින්තූර ගණන 12 කි. පින්තූර පොත සම්පූර්ණ වීමට තව පින්තූර කීයක් අවශ්‍යද?</td></tr>
<tr><td>3 6<br>- --- ---</td><td rowspan="2"></td><td>2 5<br>- 1 5</td><td rowspan="2"></td></tr>
<tr><td>2 2</td><td></td></tr>
</table>